


ජාත්‍යන්තර ක්‍රීඩා තරඟවලට සත්කාරකත්වය ඉල්ලීමද අද ජාත්‍යන්තර සූදුවක්ව පවතී. ක්‍රීඩා සමුළුවල ඡන්දය දිනා ගැනීමට විවිධ දොළපිදේනි, සත්කාර පමණක් නොව නම්බුනාම පවා පිදීමට සිදුව ඇත. 2016 ඔලිම්පික් උළෙල ඇමරිකාවේ චිකාගෝ නගරයට ලබා ගැනීමටත්, 2018 ලෝක පාපන්දු ශූරතා තරඟාවලිය මහා බ්‍රිතාන්‍යයට ලබාගැනීමටත් අනුචිත උපක්‍රම ඒ ඒ රටවල් යෙදූ බව කියන අතර රාජ්‍ය නායකයෝම එසේ කිරීමට පෙළඹුණ බව පෙනිණ. 2014 වසර පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩාතරඟ පැවැත්වෙන්නේ බ්‍රිතාන්‍යයේ ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ නගරයේය. 2018 දී ශ්‍රීලංකාවේ හම්බන්තොටදී පැවැත්වීමට කළ ඉල්ලීම පරාජය වූ නිසා එය ඔස්ට්‍රේලියාවේ ගෝල්ඩ්කෝස්ට් නගරයේදී පැවැත්වෙනු ඇත.

හම්බන්තොටදී එම ක්‍රීඩා උළෙල පැවැත්වීමට කළ සැළසුමේදී බොහෝ දෙනා මහන්සි වූහ. විශාල වියදමක් දරා ඇත. එහෙත් ඉන් සිදුවූ එක් යහපතක් නම් පොදුරාජ්‍ය මණ්ඩලය තුළ තරඟකාරීව සත්කාරකත්වය ඉල්ලීමේ ශක්තිය අපට ඇති බව ඒත්තුගැන්වීමය.

මෙම දේශපාලනමය ක්‍රියාවලියේදී දේශපාලනමය නොවන තීරණගත් දේශපාලනඥයින් දෙදෙනෙකු ගැන සටහන්කිරීම සුදුසුය.

යම්හෙයකින් 2018 වනවිට විපක්ෂය බලයට පැමිණිය හොත් වත්මන් රජයේ සැලසුම අනුව කෙරුණු පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල නොවෙනස්ව සිදුකරන බවට විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහතා ලිඛිතව පොදුරාජ්‍ය මණ්ඩලයට සහතික විය.

තවද රජයේ නියෝජිත පිරිස සමග එක්ව පොදුරාජ්‍යමණ්ඩලීය ක්‍රීඩාතරඟ උළෙල ලංකාවට ලබාගැනීමට අර්ජුණ රණතුංග මන්ත්‍රීවරයා පෞද්ගලිකවම සහභාගිවීම ය.

යට කී ඒ සියළු දේවල් ගැන කල්පනාකර බලන කල්හි කොපමණ වැයම් කල ද වර්තමානයෙහි ක්‍රීඩාවෙන් දේශපාලනය දුරස්කර තැබීම ඉතා අසීරු කටයුත්තක් බව පෙනේ.

**Oxford, UK**

# තිස්ස - ලීලා රත්නායක යුවල

# විවා දිවියේ ආදර්ශමත් 50 වසරක්!

# Exemplary 50 years of marriage!

**ති**ස්ස රත්නායක සහ ඔහුගේ පෙම්වත් බිරිඳ ලීලා එක්සත් රාජධානියේ ක්‍රොයිඩන් පෙදෙසේ වෙසෙන දේශප්‍රේමී යුවළකි. එසේම ඔව්හු බැතිමත් බෞද්ධයෝ වෙති. තිස්සගේ ගම කුරුණෑගල වන අතර ලීලා මතු ගමය. යාළුවෙකුගේ මාර්ගයෙන් හඳුනා ගත් ඔව්හු පෙමින් බැඳී 1961 වසරේදී ශ්‍රී ලංකාවේදී විවාහ ජීවිතයට ඇතුල් වූහ. 70 දශකයේ අගභාගයේ එක්සත් රාජධානියට පැමිණි ඔවුන්ට දියණියන් තිදෙනෙකු හා පුතෙක් ද සිටිති. ඔවුන් සියළු දෙනා ද විවාහක ය.

විවාහයෙන් 50 වසරක් ගෙවීමේ ස්වර්ණ ජයන්තිය මේ යුවලට නොබෝදා දරුවන්ගේ සහ හිතවතුන්ගේ ප්‍රමුඛත්වයෙන් ලන්ඩනයේදී සමරන්නට අවස්ථාව උදාවිය. එය ඉතා චාම් උත්සවයක් වූ බව කියති. කිසිදු ප්‍රසිද්ධියක් බලාපොරොත්තු නොවන තිස්ස හා ලීලා යුවල මේ ගැන පුවත්පතක ලියනවාට කැමති වුණේ නැත. මේ ඡායාරූප පවා මා ඔවුන්ගෙන් ඉල්ලා ගත්තේ දින කීපයක් පෙරැත්ත කිරීමෙන් පසුව ය.

එහෙත් මේ විවාහ ස්වර්ණ ජයන්තිය (Golden Jubilee) ගැන නොලියා බැරිය. මෙය ඉතා කලාතුරකින් වන දෙයකි. ඉදිරි කාලයේ මෙවැනි අවස්ථාවක් හාවා හඳ දකින්නා වැනි ඉතා දුර්ලභ දෙයක් වෙනවා නිසැකය. වර්තමානයේ සමහර කසාද මාසයක් වත් නොපවතින තත්වයට පත්ව ඇති බව පෙනෙන කල සහ සමහර පවුල් වල සැමියන් බිරියන් ඇන කොටාගෙන පොලීසි උසාවි ගානේ යනු දකින විට සහ උසාවිවල ගොනුවී ඇති සිය ගණන් දික් කසාද නඩුපැවරුම් ගැන අසන විට අවුරුදු 50 ක් විවාහයක් පැවතීම සැබැවින්ම ආශ්චර්යයකින් මෙපිට දෙයක් නොවේ.

ඒ නිසා මේ රත්නායක යුවළගේ 50 වසරක විවාහ ජීවිතය සැමරීමමෙහි ඉතා විශිෂ්ඨ, එමෙන්ම නූතන තරුණ සිංහළ පරම්පරාවට ආදර්ශමත් පැවැත්මක් හා වටිනා මානව සංස්කෘතියක් පිළිබඳ කියා පාන විශාල පණිවුඩයක්ද වෙයි. එවැනි දෙමාපියන් ලැබීම සැබැවින්ම වාසනාවකි.

තිස්ස - ලීලා ඔබ දෙදෙනට දීර්ඝායු පතමු!

♦ දයා




This is **1961 October 25th**, the day they married in Sri Lanka. See the radiant smiles on the faces.! (Photograph by one of the renowned photographers of 60s era in Sri Lanka, late **Daya Ranaweera** )

## Tissa & Leela Ratnayake

Leela and Tissa Ratnayaka, living in Croydon, Surrey, UK are a patriotic, Sinhala Buddhist couple totally in love with each other.

Recently they celebrated the Golden Jubilee of their marriage. Just seeing these two photographs (then and now) would tell any one what a happy marriage they have. Not just for a mere 20 years or something but for 50 years! Wow! Their kids planned a grand celebration with toast, et al. (They have four loving children, 3 daughters and a son and grand children too)

It is not everyday that you come across couples that have been in a wedlock for 50 years. It is a golden jubilee and it calls for nothing less than a special anniversary wedding celebration. 50 years is a huge time span and there has been too much water under the bridge. Thus considering the special sentiments and the bond between the couple, it calls for a toast. Lets spread the merriment and propose 50th anniversary toast for this special couple.

**50 Cheers for Tissa and Leela!**

**Smiles say it all.**

**If we compared both pictures, then and now, we wouldn't see any difference. Their happiness and togetherness after 50 long years, just stay the same. That's the beauty and blessing of a happy marriage.**



Tissa and Leela surrounded by their children




පින්තූර දෙක සසඳා බලන්න ! වෙනසක් තිබේද? නැත !

එදා ඒ ප්‍රීතිමත් සිනා අදත් එලෙසම ඇත!

HolidayAir A Travel Experience to Remember
The No. 1 Agent to Sri Lanka
Do not book your Air Ticket with any other travel agent until you speak to us!
Best Value Deals to Colombo
JET AIRWAYS £180 +Taxes 1st Jan - 30th Jun 2012
ETIHAD £185 +Taxes 1st Jan - 30th Jun 2012
GULF AIR £205 +Taxes 1st Jan - 30th Jun 2012
KUWAIT AIRWAYS £225 +Taxes 1st Jan - 27th Mar 2012
OMAN AIR £300 +Taxes 1st Jan - 29th Feb 2012
QATAR AIRWAYS £305 +Taxes 1st Jan - 24th Mar 2012
SriLankan £320 +Taxes 1st Jan - 30th Mar 2012
Business Class QATAR AIRWAYS £1060 +Taxes 28 Dec 2011
Flights to Sri Lanka on SriLankan
We will not be beaten on Price! That's a promise!
If you find a cheaper quote from Any agent Any day Any class WE WILL DOUBLE THE DIFFERENCE!
Terms and conditions apply.
0208 440 0770 www.holidayair.com
96 High Street, Barnet, Herts EN5 5SN Open 7 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm, Sun 10.00am-4.00pm
Skype us on holiday.air facebook Holidayair Holidays ATOL PROTECTED IATA MCG